# දිරිය මව්වරුන්ගේ කථාපෙළ

කාන්තා බැංකු ප්‍රකාශණයකි - 2004 ජුනි



# මා හිමි ගල පැහිණෙව්

කතෘ

නුවරගල එ. ඇම්. ධම්මැණිකා

රු. 45/-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පෙරවදන

මෙම කුඩා පොත් පිංච නව සාහිත්‍යමය වටිනාකම් රැසක් සමඟ ඔබ අතට පත්වන්නේ. 'දිරිය මව්වරුන්ගේ කතා' නම් වූ පොත් පෙළක එකකි මේ.

මෙම පොත් පිංච ශ්‍රී ලාංකීය දුප්පතුන්ගේ සාහිත්‍ය වංශයේ ආරම්භය සනිටුහන් කෙරේ. මෙහි අන්තර්ගතයේ නිරූපනය වන්නේ පොත් පිංච ලියූ ලේඛිකාවගේ ජීවිතයෙන් බිඳක් පමණි. ඇගේ අත්දැකීම් සම්භාරයෙන් බිඳක් පමණි. ඒ බිඳ ඇයට ලියවුනු සැටිය.

අපි චරිත කථා කියවා ඇත්තෙමු. ඒ කථාවන්හි නිරූපිත වන්නේ බොහෝ විට සමාජයේ ඉහළ ස්ථරයේ පුද්ගලයින්ය. සම්භාව්‍ය ලේඛකයන් විසින් ලියූ හෝ තමන්ම විසින් ලියූ ඒ සෑම චරිත කථාවක්ම කලින් කල අප සමාජයේ විසූ ප්‍රභූන්ගේය. ඒ කථාවල 'සාර' කොටස උකහාගෙන අපේ ජීවිත සකස් කර ගැනීමට ඒ කෘති සමාජයට බෙහෙවින් ඉවහල් විය.

එහෙත් මේ කථා වෙන් විවරණය වන්නේ එම කථා ලියූ ලේඛිකාවන්ගේ ජීවන අරගලයේ අංශු මාත්‍රයකි. මේ ජීවිත වලින් උකහාගත හැකි හරයන් කොයි ආකාරයකින් ඔබ වැළඳ ගනී දැයි මට කියන්නට බැරිය. එහෙත් මේ අපේ ජන ජීවිතය. ශ්‍රී ලාංකීය ජන සමාජයේ දුක් මහන්සිවී වැඩ කරන අපේම සහෝදර ජන ජීවිතයන්ය. දුක් දොම්නස්සයන් හෝ සෝමනස්සයන් ගෙන් බිඳක් තමන් වැනිම වූ දහස් සංඛ්‍යාත මවුවරුන් අතට පත්වන විට ඔවුන්ගේ ජීවිතයේ මුල් වරට අපමණ සතුටක් ලැබේ යැයි මම සිතමි.

මේ ලේඛිකාවෝ කවරදාකවත් මෙබඳු උත්සහායක් ගෙන නැත. මේ නව උත්සහාය නිරන්තරව ගොඩනැගෙන්නාවූ දුප්පතුන්ගේ සාහිත්‍යයක් දෙසට පියවර තැබෙන්නේ යැයි මට සිතේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප කියවා ඇති බොහෝ කෙටි කථාවන්හි නව කථාවන්හි නිරූපනය වන චරිතයන්ද ඇතැම් විට චරිත කථා වල ප්‍රධාන චරිතය පෝෂණය කරන්නාවූ අවිශේෂ චරිතද එම කථා තුළ මතු කර ගත්තේ නැතහොත් නිර්මාණය කර ගන්නේ උගතුන්ය. ඔව්හු ලේඛකයෝය. ගත් කතුවරයෝය. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝය. එහෙත් මේ කථා පිංචෙහි ප්‍රධාන චරිතය ලේඛිකාවගේමය. ඇය ශ්‍රී ලාංකීය ජන සමාජයේ සමාජ ආර්ථිකයේ පහළ ස්ථරයේ සාමාජිකාවකි.

කාන්තා බැංකු ප්‍රකාශණයක්වූ මව්සින් සංග්‍රහ කෙරුණු 'සංවර්ධනයේ සැබෑ හඬ'ට (1998) පෙර වදනක් ලියූ දිවංගත මහාචාර්ය සිරිසේන තිලකරත්න ශූරීන් 'අප රටේ සංවර්ධන සාහිත්‍යයේ මනා හිඩැසක්' ඇතැයි ලීවෝය. මෙම කුඩා පොත් පිංච ඇතුළත් වන 'දිරිය මව්වරුන්ගේ කතා' පොත් පෙළ එම හිඩැස පිරවීමට තරමක් දුරටවත් උපයෝගී වේ යැයි මම සිතමි.

මෙම කතුවරියගේ සමාජ ස්ථරය නියෝජනය කරන මවුවරුන් මෙබඳු කුඩා පොත් ලියැවීමට පෙළඹවීමත් කියැවීමට පෙළඹවීමත් අපගේ උත්සාහයයි. එමඟින් තමන් සේම ජීවන අරගලයේ යෙදෙන දහස් සංඛ්‍යාත මවුවරුන්ට මෙම ලේඛිකාවගේ හද ගැස්ම හඳුනාගැන්මටත් එමඟින් ඇය තම පවුලේම සාමාජිකාවක් කර ගැනීමටත් අවකාශ ලැබේ යැයි මම සිතමි.

සකස් කල යුතුම වී නම් මිස මේ ලේඛිකාවගේ වියරණයට ශෛලියට හෝ අන්තර්ගතයට අප අත තිබ්බේ නැති තරම්ය. අන්තර්ගතයේ වගකීමද ඔවුන්ගේය.

විහඟ ග්‍රැෆික් අධිපති ආර්.ඒ.රත්නසිරි මහතාට විශේෂ ස්තූතිය පිරිනැමිය යුත්තේ මෙම මුද්‍රණ කටයුතු සමාජ යුතුකමක් ලෙස සලකා ඔහු අප හා එක්ව සිටින බැවිනි.

තවද මෙම 'දිරිය මව්වරුන්ගේ කතා' පෙළ සංස්කරණය කිරීම පරිවර්ථනය කිරීම හා සුදුසු පරිදි පෙළගැස්වීම කල අප සාහිත්‍ය කමිටුවේ

දීපිකා නිලාංගනී
බෝධිපාලී සමරකෝන්
අනූෂා තම්බිරාජා
කේ. සිරිමතී යන සාමාජිකාවන්ට ද කාන්තා බැංකුවේ උපදේශක වරයෙකු වූ ජස්ටින් කැප්පෙටියගම මහතාට පරිවර්තන කටයුතු වලදී හා අවශ්‍ය එලදායි අදහස් ඉදිරිපත් කිරීමෙන් දැක්වූ සහයටද අපගේ ස්තූතිය පිරිනැමේ.

දෙමළ බසින් මෙම කථාපෙල පරිඝනක ගත කල කාන්තා බැංකුවේ සාමාජිකාවකගේ දියණියක වූ සුජානි ප්‍රියංගිකා තිරාණ ගමගේ මෙනෙවිය ද සිංහල බසින් පොත් පෙළ පරිඝනක ගත කල කාන්තා බැංකුවේ සාමාජිකාවක වූද බණ්ඩාරනායක පුර ප්‍රාදේශිකයේ විගණන කමිටුවේ සාමාජිකා එස්. අප්සරා දිල්රුක්ෂි මෙනෙවිය ද ඉටුකල කාර්යභාරය ආදරයෙන් සිහිපත් කල යුතුය.

නන්දසිරි ගමගේ
2004 ජූනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# முன்னுரை

இந்த சிறிய புத்தகங்கள் புதிய இலக்கிய பெறுமதி வாய்ந்தவையாக உங்கள் கைக்கு கிடைக்கிறது. ஏழ்மையான தாய்மார்களின் ''தைரியமான தாய்மார்களின் கதைகள்'' என்னும் புத்தக வரிசையில் இதுவும் ஒன்று.

இந்த சிறு புத்தகங்கள் ஸ்ரீ லங்காவின் வறியவர்களின் இலக்கிய வம்ச ஆரம்பத்தின் அடையாளமாகும். இதில் உள்ளடக்கப்பட்டுள்ளவை புத்தகத்தை எழுதிய கதாசிரியரின் வாழ்க்கையின் அனுபவங்களில் ஒரு துளி மாத்திரமே. அந்த துளியை அவள் எழுதிய விதம்.

நாங்கள் நடத்தை கதைகளை வாசித்துள்ளோம். அந்த கதைகளில் உள்ளடக்கப்பட்டிருப்பவை நிறைய சந்தர்ப்பங்களில் சமூகத்தில் உயர்ந்த நிலையில் இருக்கும் நபர்களை பற்றியவை. உயர்ந்த கதாசிரியர்களால் எழுதும் அல்லது தங்களால் எழுதும் அந்த எல்லா நடத்தை கதைகளும் முன்பு எங்கள் சமூகத்தில் வாழ்ந்த பிரபுகளுடையவை. அந்த கதைகளில் ''நல்ல'' பகுதி எடுத்து எங்கள் வாழ்க்கையை கொண்டு செல்ல அந்த கதைகள் சமூகத்திற்கு நிறைய பிரயோஜனமாய் இருந்தது.

ஆனால் இந்த கதைகளின் விபரணம் இந்த கதையை எழுதிய கதாசிரியரின் வாழ்க்கை போராட்டத்தில் ஒரு பகுதியே. இந்த வாழ்க்கை கதைகளில் பெற்றுக் கொள்பவை எவ்வாறு இருக்கும் என்பதை என்னால் கூற முடியாது. ஆனால் இது ஸ்ரீ லங்காவில் கஷ்டப்பட்டு உழைக்கும் சகோதர மக்களின் வாழ்க்கையே. இன்ப துன்பம் இரண்டிலும் ஒரு துளி தங்களை போன்ற ஆயிரக்கானக்கான தாய்மார்களின் கைகளில் கிடைக்கும் போது அவர்களின் வாழ்க்கையில் முதல் தடவை அளவில்லாத மகிழ்ச்சி அடைவார்கள் என நான் நினைக்கிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இந்த கதாசிரியர்கள் ஒரு நாளும் இது போன்ற முயற்சி எடுத்ததில்லை. இந்த புதிய முயற்சி நிரந்தாமாக கட்டியெழுப்பப்பட்டு வறிய மக்களின் இலக்கியத்தின் படியாக இருக்கும் என்று நான் நினைக்கிறேன்.

நாங்கள் வாசித்துள்ள சிறு கதைகளில், நாவல்களில் காட்டப்படும் கதாபாத்திரத்தில் சில வேளைகளில் நடத்தை கதைகளில் பிரதான கதாபாத்திரத்தை போஷிக்கும் விசேடமல்லாத கதாபாத்திரங்கள் அந்த கதைகளில் தோன்றாவிட்டால் உருவாக்குவது புத்திசாலிகளே. அவர்கள் கதாசிரியர்களாகவோ புத்திமான்களாகவோ இருப்பார்கள். ஆனால் இந்த கதைகளில் பிரதான கதாபாத்திரம் கதாசிரியரே.அவள் ஸ்ரீ லங்காவின் மக்கள் சமூகத்தில் சமூக பொருளாதாரத்தில் கீழ் மட்டத்தில் உள்ள அங்கத்தவர்.

மகளிர் வங்கியின் விருந்தாக நான் வெளியிட்ட அபிவிருத்தியின் உண்மைக் குரல் என்ற நூலுக்கு முன்னுரையை எழுதிய அமரர் பேராசிரியர் சிறிசேன திலகரத்ன அவர்கள். எங்கள் நாட்டின் அபிவிருத்தி இலக்கியத்தில் வெறுமை காணப்படுகிறது என்று எழுதினார். இந்த சிறு புத்தகங்களில் உள்ளடக்கப்படுவது “தைரியமான தாய்மார்களின் கதை” என்ற புத்தக வரிசையில் அந்த வெறுமையை நிரப்புவதற்கு இது சிறிதேனும் பிரயோசனமாய் இருக்கும் என நான் நினைக்கிறேன்.

இந்த கதாசிரியரின் சமூக மட்டத்தை காட்டும் தாய்மார்கள் இது போன்ற சிறு புத்தகங்களை எழுதுவதற்கு தூண்டுதலும் வாசிப்பதற்கு தூண்டுதலும் எங்கள் முயற்சியாகும். இந்த வழியில் தங்களை போன்று வாழ்க்கை போராட்டத்தில் ஈடுபடும் ஆயிரக்கானக்கான தாய்மார்களுக்கு இந்த கதாசிரியர்களின் இதய துடிப்பை புரிந்துக் கொள்ளவும் இந்த முறையில் அவர்கள் குடும்பத்தின் அங்கத்தவராகி கொள்வதற்கும் வாய்ப்பு கிடைக்கும் என நான் நினைக்கிறேன். இதை சரி செய்ய வேண்டி இருந்தால் மாத்திரம், இந்த கதாசிரியரின் விபரனை விதத்திற்கு அல்லது உள்ளடக்கத்திற்கு நாங்கள் கை வைக்கவில்லை உள்ளடக்கத்திற்கு பொறுப்பு அவரே.

“விஹங்க கிரப்பிக்ஸ்” அச்சகத்தின் உரிமையாளர். ஆர்.ஏ. ரத்னசிறி அவர்களுக்கு விசேட நன்றியை தெரிவித்துக் கொள்ள வேண்டியது இந்த பதிப்பு வேலைகளை சமூக சேவையாக எண்ணி அவர் எங்களுடன் சேர்ந்திருப்பதால்.

இன்னும் இந்த “தைரியமான தாய்மார்களின்” கதை வரிசையை பதிப்பு செய்தல் மொழிபெயர்பு செய்தல் அத்துடன் சரியான முறையில் நிரல்படுத்திய எங்கள் இலக்கிய குழுவின்

திபிகா நிலாங்கனீ
போதிபாளி சமரகோன்
அனுஷா தம்பிராஜா
கே. சிறிமதி ஆகிய அங்கத்தவர்களுக்கும் ஜெஸ்டின் கெப்பெட்டியகம அவர்களுக்கும் எங்கள் நன்றியை தெரிவித்துக்கொள்கிறேன்.

தமிழ் மொழியில் இந்த கதை வரிசையை கணணி மயப்படுத்திய மகளிர் வங்கியின் அங்கத்தவரின் மகளாகிய திரான கமகே சுஜானி பிரியங்கிகா அவர்களுக்கும் சிங்கள மொழியில் புத்தகத்தை கணணி மயப்படுத்திய மகளிர் வங்கியின் அங்கத்தவராகிய பண்டாரநாயகபுர கிளை வங்கியின் கணக்காய்வாளர் குழுவின் அங்கத்தவராகிய ஏஸ். அப்சரா தில்ருக்ஷி அவர்களும் செய்த காரியங்களை அன்புடன் ஞாபகப்படுத்துகிறேன்.

நந்தசிறி கமகே,
2004 ஜீன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# Forward

This booklet comes to your hand with so much literary values. This is one book of a series called 'Enduring Mothers'.

This booklet remarks the new era of the literature lineage of the poor Sri Lankans. There is only a few portion of the life of the writer portrayed in this context. It is only a tiny portion of her experience. It is the little how she could write.

We have read biographies. Mostly the persons belong to elite class had been painted in those books. Every biography written by classic writers or by self of the elites of the society lived contemporary. Those works helped much to the society to get shaped of our lives absorbing the essence of them.

But these stories reveal you only a small bit of the struggle of their lives for survival of these writers. I cannot say how and in what way you embrace the essence of these lives. Anyhow these are our folk lives. They are our own folk who work hard and painstakingly in Sri Lankan society. I Think When thousands of mothers have an opportunity to feel a bit of sense of sadness and distress ness of the lives of these writers would be enormously pleasant for the first time in their lives.

These writers have never had this type of an effort. I think this new effort would be a step towards a literature of poor continuously compiling.

It was the learned people who created or yarned the characters from the short stories or in novels and sometimes the characters

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

nourished the main character in biographies that we had read. They are writers or authors. They are much heard. But the main character of this book belongs to the writer. She is a member of the lower segment of this Sri Lankan socio-economic society.

Late Professor Sirisena Thilakarathna wrote '....there is a conspicuous lacuna in the development literature' in a forward to the 'Real Voices in Development' (1998) that was compiled by me. I think this series of books 'Enduring Mothers' would help to fill this lacuna up to a certain extent.

Our effort is to encourage mothers of this socio-economic segment that represent the writer to write such small stories and to promote their reading. I think that the mothers who struggle for survival get the opportunity to understand the heart beat of this writer and make her a member of their homes. I was careful to do nothing to the context or to the pattern or the grammar unless necessarily changeable. The responsibility of the context is on writer.

I would like to offer my special thank to Mr. R.A.Rathnasiri the proprietor of Vihanga Graphic is always with us considering the Printing Work of the Women's Bank as a duty.

Mrs Deepika Nilangani,
Mrs Bodhipali Samarakoon,
Miss Anusha Thambirajha,
Mrs K.Sirimathie are the members of the Women's Bank on one hand and on the other hand they worked as a team to translate, to edit and to line up the stories according to its significance. My sincere thanks to them.

Mr Justin Keppetiyagama, a consultant of the Women's Bank assisted us in translations and making constructive comments for improvement.

I thank Miss Sujani Priyangika Thiranagama a daughter of a Women's Bank member did the Tamil computerization and Miss S. Apsara Dilrukshi a member of Women's Bank and a Member of the Auditing Committee of the Bandaranayaka Pradeshikaya for her Sinhala computer work.

Finally I pay my gratitude to all mothers who converted their sweat and tears into words and placed carefully on these valuable documents willing to reveal those words to the world.

Nandasiri Gamage.
27th JUNE, 2004.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බුදුසරණයි.

මගේ නම ඒ.ඇම්.කිරිමැණිකා. මගේ වයස අවුරුදු 42කි.
උපන් දිනය 1960-11-22

මා හිතවත් දයාබර මෑණිවරුන් හා පියවරුන්ගෙන් අවසරයි. මේ කතා පුවත ලිවීමට පෙර ඔබ සියලු දෙනාට මගේ අවංක ආදර ස්තූතිය පුද කර සිටිමි.

ඒ වාගේම මගේ කතාව මට හැකි අයුරින් මතක තියෙන හැටියට ලිවීමට බලාපොරොත්තු වෙමි. මේ කතාවෙහි ගොඩක් වැරදි වෙන්න පුළුවන්. එයට මම මුලින්ම සමාව අයැද සිටිනවා. ඒ මොකද මම 5 වසර දක්වා ඉගෙන ගෙන ඇති නිසාය.

මගේ අම්මල, අප්පච්චිල අප පොඩි කාලයේ හිටියේ නෙල්ලියේ. එම ගමේ ටික කාලයක් ඉන්න විට අපට ඉඩම් ලැබුනා හක්වටුන ව්‍යාපාරයේ ඉඩම් ලැබෙන කොට අපිට අවුරුද 6ක් විතර ඇති. අපේ අම්මයි, අප්පච්චියි අපේ කිරි අම්මා ළඟ අපිව දාලා ඒ ඉඩම් වලට ගිහිල්ලා ඒවා වවලා නැවත අවුරුදු 02ක් විතර ගියාට පසු අපිව එක්කරගෙන එහෙට ගියා. ඒ කාලේ කුඹුරු වල ගෙවල් හදාගෙන පදිංචි වුනා. ඉන්පසු ගොඩ ඉඩම් වල ආණ්ඩුවෙන් ගෙවල් හදලා දුන්නා. අපේ ගමට කියන්නේ බෝගොල්ලයාය කියලා. ඒ ව්‍යාපාරයේ ඉඩම් වල පොල්, කෙසෙල්, මං, කව්පි, කුරක්කන් වගේ දේවල් තමා වවන්නේ නව අල වර්ග එහෙමත් වැව්වා. අපට කුඹුරු ලැබුනාට කන්නක් ඇර කන්නක් තමා පෑහෙන්නේ. දෙමාපියෝ අපිව ජීවත් කරවන්න බොහොම වෙහෙස මහන්සි වුනා. අපේ ගෙදර ගැහැණු දරුවන් 4යි පිරිමි ළමයි 4යි. එයින් මමයි මගේ අක්කයි නිවුන් සහෝදරියන්. මම පොඩිකාලේම ඇදුම රෝගියෙකු වුනා. මාව බේරගන්න මගේ අම්මලා, අප්පච්චිලා ගොඩාක් දුක් වින්ඳා.

අපිට ඉස්කෝලේ යන්න සැතපුම් 2 ක් විතර තියෙනවා. ඒ කාලයේ ගමන් පහසුකම් නැහැ. අපි පයින් තමා ඉස්කෝලේ යන්නේ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එන්නේ. ඒ කාලේ දැන් වගේ නෙවේ. ලියන්න ගල්කුරු, ගල්ලෑලි තමා තිබුනේ. ඉතින් එක දවසට ගල්ලෑල්ල බිඳෙනවා. ඒ දවසට ගුටි කනවා. ඒ කාලයේ හරියට ගුරුවරු සැරයි. දැන් වගේ නෙවෙයි. හරියට ගහනවා. අක්කයි මමයි එක පන්තියට තමා බාර දුන්නේ. මම ඉස්කෝලේ වැඩ කරන්නේ නැතුව ඉන්නවලු අක්කා ළඟට වෙලා. එහෙම අවුරුදු 2ක් විතර වෙනකොට මාව වෙන පන්තියකට දාලා. අක්කා වෙන පන්තියකට දමලා හිටියත් බැහැලු බේරෙන්න. අක්කාගේ පන්තියටමලු යන්නේ. ඉතින් මම අක්කා ළඟට වෙලා හිටියා මිසක ඉගෙන ගන්නේ නෑ.

ඒ කාලේ එකට හිටිය නිසා අපිව වෙන් කරන්න බැරි වුනා. ඇත්තටම අපි එක්කෙනෙක් නැතිව අනෙකා ඉන්නේ නැතිලු. අපිට පොඩි දවස් වල ලෙඩක් හැදුනාම එකටමලු හැදෙන්නේ. මට හොඳට මතකයි මම නැත්නම් අක්කා හොයනවා. අක්කා නැත්නම් මම හොයනවා. ඉතින් එහෙම තමා අපි කාලය ගත කලේ.

අපේ පවුලේ ලොකු පිරිමි නැහැ. අපි තමා ගෙදර වැඩට උදව් වෙලා හරකා බාන බැඳගෙන සිටියේ. අප්පච්චි කුඹුරු වැඩ කරන්න ඕනෑ. කුලී වැඩ වලට යන්නත් ඕනෑ. අපිට අද වගේ මතකයි. අම්මා පාන්දර ගිහින් රෙදි පෝලිම් වල ඉඳලා තමා අපිට රෙදි ගෙනත් දෙන්නේ. ඒ වගේම ලොකු ආහාර හිඟයක් තිබුනා ඒ කාලේ. අම්මා පාන් පෝලිම් වල ඉඳලා පාන් ගේනවා. අපි ඒ විදියට ඉස්සර ගොඩක් දුක් වින්දා.

දවසක් අක්කයි මමයි ඇලට නාන්න ගියා. ඊට පසු මම ඇලේ ගහගෙන ගියා. අක්කා කෑගහලා එතන ළඟ නාමින් සිටි මාමා කෙනෙකුට ඇහිලා මාව ගොඩට අරගෙන තියෙන්නේ. ඊට අවුරුදු 2 ක් විතර ගියාට පසු මම ළිඳට වැටිලා එක පාරක් උඩට එනකොට ගඩොල් කැටයකින් අල්ලගෙන හයියෙන් කෑ ගහලා. එතකොට අම්මලා, අප්පච්චිලා ඇවිල්ලා මාව ගොඩට අරගෙන තිබෙනවා. එතකොට ළිඳේ වතුර ගොඩක් තිබිලා. මම ඒ වගේ අනතුරු රැසකට මුහුණ දීලා තියෙනවා.



අපි ඒ කාලේ සහනාධාර වැඩ වලට ගියා. ගොඩක් දුක් වින්දා. පස් කූඩා ඉසේ තියාගෙන පස් ඇදපු හැටි මට මතකයි. මෙහෙම දුක්විඳින පීඩාකාරී ජීවිත අප කුඩා කල ඉඳලා ගෙවලා තියෙනවා. පාන් පිටි රොටි, කුරක්කන් රොටි කනවා. හැමදාම එහෙම කනකොට ජීවිතය එපා වෙනවා. එක දවසක් මඤ්ඤොක්කා පිඟානට මම පයින් ගැහුවා. අප විවාහ වන වයසේදී මව්පියන්ගේ කැමැත්ත පරිදි අක්කගෙයි, මගෙයි, මඟුල් ගෙවල් එකට ගත්තා. අපි 1981-03-25 තමයි විවාහ වුනේ. කසාද බැඳලා මහත්තයලාගේ ගෙදර අවුරුදු 3 ක් හිටියා. මගේ සැමියාගේ අයියගේ ඉඩම් කෑල්ලක් තිබුණා. අපට ඒ ඉඩමේ ගේ හදාගෙන ඉන්න කිව්වා. අපි ඒ ඉඩමේ ගේ හදාගෙන පදිංචි වුනා. මෙහි කාලයක් ගෙවුනා. ඒ කාලය තුළ අපිට දරුවන් තුන්දෙනෙක් ලැබුනා. දරුවන්ගේ කකුල් වල තුවාල වගයක් හට ගත්තා. ඒවාට වෙදකම් කර සුව වෙන්න ගොඩාක් කල් ගියා.

අපිව ජීවත් කරන්න මගේ සැමියාට හරි හැටි රැකියාවක් තිබුනේ නැහැ. මගේ සැමියා අපිව ජීවත් කරේ කලු ගල් කඩලා. දරුවන්ට බෙහෙත් ගන්න යන්න එන්න විදිහක් එයාට තිබුනේ නැහැ. වැඩට නොගියොත් පාඩුයි. කලුගල් කඩනවා කියන්නේ පොඩි වැඩක් නෙවෙයි. හරිම අමාරුයි. ඉතින් වැඩට නොගියොත් එදාට ජීවත් වෙන්න සල්ලි හොයන්නේ කොහොමද කියලා එක දවසක්වත් ඉන්නේ නැතිව වැඩට යනවා. මම තනිවම පොඩි දරුවන් වඩාගෙන බෙහෙත් ගේන්න යනවා.

කොපමණ අමාරු වුනත් ඒ කාලේ අපට ආහාර මුද්දරවත් තිබුනේ නැහැ. මම දිසාපති කාර්යාලයට ගොස් තමා ආහාර මුද්දර හදා ගත්තේ. මට අද වගේ මතකයි. ආහාර මුද්දර රුපියල් 25 ටත් අඩුව ළමයින්ට තිබුනේ.

අපි බැඳලා ගමේ වැඩි කාලයක් ගතකරේ නැහැ. අවුරුදු 7 ක් 8 ක් විතර ඉන්න ඇති. ඉන්පසු අපට මහවැලි 'සී' කලාපයේ ඉඩම් ලැබුනා. ඒවත් නිකම්ම ඉඳලා හම්බ වුනා නෙවෙයි. ගොඩක් මහන්සි වෙලා ඒවාට ඉල්ලුම් පත්තර දාලා තමා ඉඩම් ගත්තේ. ඉල්ලුම් පත්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුමා අවුරුදු 1 1/2 විතර කාලයක් සිටියා. ඉඩම් වලට අනුමත වෙලා ආවේ 1988-06-22 දීය. ඒ කාලයේ අපි මහවැලියට එනකොට මහ ගන කැලෑව. අපට ඉඩම් වලට එනකොට හම්බකරගත් දෙයක් කියලා තිබුනේ නැහැ. රු 375 ක් අරගෙන තමා ආවේ.

මහවැලියට එන්න මගේ සැමියාට ලොරියකට බඩු පටවලා දුන්නා. ඉතින් එයාට තනියට එන්න කෙනෙක්වත් හිටියේ නැහැ. ඉස්සර වෙලා එනකොට ඉඩම් ලාභියෙක් කියලා එක්කන් එන්න කෙනෙක් නැහැ. එක්කෙනෙක් වත් නැති නිසා ඒවෙලේම මම මගේ ගෙදර ගිහින් අප්පච්චි අඬ ගහගෙන ආවා. ඒ එනකොට රෑ 8 විතර වුනා. මගේ අත දරුවට මාස 10 ක් විතර ඇති. එයත් දාලා මම ගියේ. මට ඒවා අද වගේ මතකයි.

ඉන් අවුරුද්දක් විතර කාලයක් ගියාට පසු මම මගේ දරුවන් දෙන්නත් එක්ක මෙහේ ඉඩම් වලට ආවා. ඒ වෙනකොට නුවරගල කුඹුරු වැඩ කරලා තිබුනේ නැහැ. මම ආවාට පසු තමා 1989 අවුරුද්දේ කුඹුරු වැඩ කරන්න පටන් ගත්තේ. අපිට හරකෙක් වත් හිටියේ නැහැ. ට්‍රැක්ටර් එකක් වත් තිබුනේ නැහැ. උදලු වලින් කොටලා තමයි අපි කුඹුරු ඉස්සේ. ඊට පසු තමා ට්‍රැක්ටර් එහෙම ගෙනාවේ. අපට කුඹුරේ බිම් ප්‍රමාණයත් අඩුවයි ලැබුනේ. අල්ලපු කුඹුරට අපේ කුඹුර ඈඳාගෙන තිබුනේ. අපි මහවැලි මහත්වරුන්ට කියලා ලියුම් දීලා තමා කුඹුරු ප්‍රශ්නේ නිරවුල් කරගත්තේ. අදටත් අල්ලපු කුඹුරු කාරයා තරහ වෙලා තමා ඉන්නේ. අවුරුදු 3 ක් විතර කුඹුරු හරියට වැඩ කර ගත්තා. ඉන්පසු කන්න 2 කින් විතර බයිසිකලයක් ගත්තා. ඉන්පසු ගේ හදන්න ඕන බඩු ටික ගෙනාවා. ඊට පස්සේ ගෙට අත්තිවාරම දැම්මා. මමත් මගේ සැමියාත් එකතුවෙලා ගඩොල් ටිකක් කපා ගත්තා. ඊට පස්සේ නැවත කුඹුරු වැඩ කර ගන්න බැරි වුනා.

වැඩ කරන ගමන් මගේ සැමියාට උණ ගැනෙනවා. මේ විදියට කන්න 2-3 විතර යන විට වැඩ කරන්න බැරි වෙලා ගියා.



ඉන්පසු පුළුවන් තරම් වෙදකම් කළා. බැරිම තැන එයා කිව්වා මැරෙන්න අරින්න කියලා. කොහොම හරි වෙදකම් කරලා ලෙඩේ සුව කරගත්තා.

එත් එයා කිව්වා මාව බේර ගන්න බෑ කුඹුරු වැඩ කරගන්න තියෙන වී ටික විකුණලා වියදම් කරන්න එපා කියලා.

එක් මොහොතකට හරි මම ඔයාව ගොඩ දානවා මහ පාරට බැහැලා හිගා ගෙන කෑවත් කියලා මම එයාට කිව්වා. මගේ සැමියා අවුරුදු 8 - 10 ක් විතර කාලයක් පමණ ජීවත් කර ගත්තේ මගේ මහන්සියෙන්. මේ වන විට දරුවන් තිදෙනෙක් පාසැල් යනවා. එක දරුවෙක් මගේ සැමියාගේ පුංචි අම්මා ළඟ ඉඳලා පාසැල් යනවා. සැමියා අසනීපව සිටිද්දිත් මම මාස 2 - 3 කට සැරයක් වත් ඒ දුව බලන්න යනවා. ඒ දුව පොඩි කාලේ ඉඳලා පුංචි අම්මා ළඟ දාලා තමයි නුවරගල ආවේ. ඒ එනකොට මෙහේ පාසල් විවෘත කරලා තිබුනේ නැහැ. ඒ දුව ශිෂ්‍යත්ව විභාගය ලියලා පාස් වුනා. ඊට පසු කුරුණෑගල මලියදේව ආදර්ශ මහා විද්‍යාලයට ඇතුලත් කළා.

අපි වාගේ දුප්පත් පවුලක දරුවෙක් ඒ වාගේ ලොකු පාසලකට යනවා කියනකොට හරිම සතුටුයි. දැන් 11 වසර සමත් වෙලා උසස් පෙළ ලිව්වා. දැනට දෙපාරක් ලියලා තියෙනවා. විශ්ව විද්‍යාලයට යන්න ලකුණු මදි නිසා මේ පාරත් විභාගයට ලියනවා. ඒ දරුවාට ඉගෙන ගන්න සල්ලි දෙන්නවත් විදිහක් නෑ.

මගේ සැමියා ලෙඩ වෙලා දැන් වසර 8 - 10 ක් විතර වෙනවා. දැනට වැඩ වලට පුළුවන් පරිදි අත් උදව් දෙනවා. මට මේ මතක තියන හැටියට තමා ලියන්නේ.

අපට උදව්වට එයාලාගේ කවුරුවත් සිටියේ නැහැ. එයා අවුරුදු 8 ක් ලෙඩ ගානේ හිටියත් කුඹුරුපිටි අස් වද්දලා දීලා කුඹුරු නිරවුල් කරලා කුඹුරු උගස් තියන්නේ නැතුව අදටත් වැඩ කරගෙන කන්න කුඹුරු තියෙනවා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගේ සැමියා හැමදාම කියනවා ණය වෙන්න එපා බේරන්න බැරිවෙයි කියලා. අපි බොහොම දුක සේ තමා කාලය ගත කරන්නේ. මා ණය වෙන්නේ එයාගේ ජීවිතය බේරගන්න. මේ අතර තුර අපේ ගමට මිණිපහනක් දැල් වුනා. ඒ කුමක්ද කියලා ඔබ සියලු දෙනාම දන්නවා ඇති මම නොකිව්වාට.

ඒ මිණි පහණ තමා මගේ කාන්තා බැංකුව. පළමුවෙන්ම අපේ ආරියවතී මෑණියනුත් කරුණාවති මහත්මියත් සමඟ කුඩා කණ්ඩායම් ක්‍රමය මේකයි කියා අපට හඳුන්වා දුන්නා. ඒ දවස අද වගේ මතක තියෙනවා.

පළමු දවසේ නුවරගල අංක 01 නිවසට එන්න කියලා අපව දැනුවත් කළා. නැවත දවසක අපි සේරම වැව ළඟ අංක 152 යන නිවෙස් වල රැස්වුනා. ඉන්පසු අපව මහ සභාවකට කැඳවලා මේ වැඩ පිළිවෙළ කරගෙන යන ආකාරය පිළිබඳව දැනුවත් කළා. කුඩා කණ්ඩායම කියන්නේ දුප්පත් අහල පහල අය විය යුතු බව දැන්නුවා. නායිකාවක්, සභාපති හා ලේකම් යන නිළධාරි තුන් දෙනා පත් කරගන්න කණ්ඩායමට උපදෙස් ලැබුනා. කණ්ඩායම සාමාජිකාවන් 5 ත් 15 ත් අතර වෙන්න ඕනෑ කියලා කිව්වා. ඒ අය අතර විශ්වාසය ගොඩනගා ගෙන සතියේ ඕනෑම දවසක රැස්වීම තියන්න තීරණය කළා. කිව්වා. අපි සතියේ අඟහරුවාදා 1.00 ට සමිතිය පවත්වන්න තීරණය කළා. ඒ දවසට අනිවාර්යයෙන්ම රු.5.00 ක් ඉතිරි කරන්න කියලා කිවුවා.

හාල් සීට්ටුවක් අපි දාගන්නවා. ඒක අපේ කණ්ඩායමේ වැඩක්. මරණයක් වුනොත් සුභ සාධකයක් එකතු කරන හැටි කියා දීලා ඒ විදිහට අපගේ ගරු නන්දසිරි ගමගේ මැතිඳුන් මේ වැඩසටහන ගමට හඳුන්වා දීලා අපට යායුතු ගමන් මාර්ගය පෙන්නුවා.

ඔබතුමා කොළඹ රටේ සිටියත් අපි අද මේ කාන්තා වැඩසටහන කොපමණ අගේ කරනවාද? මොනතරම් දුප්පත් කාන්තාවන් අසරණ වෙලා සිටියාද? අප අවට ගම් නියම් ගම් සිසාරා මේ මානෙල් මලක



සුවඳ පතුරන්නා සේ මේ කණ්ඩායම් වැඩ පිළිවෙල අපගේ හදවත් තුළට කා වැදිලා හොඳ නරක තේරුම් ගෙන තියෙන්නේ.

මේ වන විට කුඹුරු උකසින් බේරගෙන සැමියාට උදව් කරගෙන, දරුවන්ගේ පාසල් යන වැඩ වලට උදව් කරගෙන ගෙවල් දොරවල්ද හදාගෙන තියෙනවා. තවද අපි අපේම කියලා වැඩසටහන කරගෙන යන අතර ගෙදරට උවමනා බඩු මුට්ටු ද අරගෙන තියෙනවා. මෙය නුවරගල විතරක් ක්‍රියාත්මක වන දෙයක් නොවේ. මුළු 'සී' කලාපයෙත් අනිකුත් ගම්මාන වලත් මුළු මහද්වීපයේම මේ වැඩසටහනෙහි සුවඳ පැතිරී ගොස් හමාරයි.

මගේ කණ්ඩායමට බැඳිලා අනිවාර්ය ඉතිරි කිරීම් රු.5 කුත් අමතර ඉතිරි කිරීම් අපට තියන හැටියටත් කළා. අප පළමුවෙන්ම රුපියල් 100 ක් තුන්වතාවක් ගනුදෙනු කරලා නැවත රුපියල් 250 ගනුදෙනු කරලා පසුව රුපියල් 500යක්.... ඒ විදිහට ගනුදෙනු කරලා ණය ක්‍රමානුකූලව කිරීම පිළිබඳව හොඳ අවබෝධයක් ලැබුනා. දිගටම මාස 8ක් මෙය කරගෙන ගියා. අපි නුවරගල බැංකු ශාඛාව තුළ විශ්වාසය ගොඩනගාගෙන එතැන් පටන් ණය අවදිය පිළිබඳව හොඳ හැටි අවබෝධයක් ඇතුව ණය ගනුදෙනු කළා. ඉතා ක්‍රමානුකූලවයි ඉහළ ණය තලයන්ට අපි ගියේ. අපේ ණය පොළිය ටිකක් ඉහළ මට්ටමකයි තියෙන්නේ.

ඉහළ ණය අවධියක සිටින නිසා කුඹුරු බේරාගෙන ගෙවල් හදාගෙන වැඩ රාශියක් කරගන්න බලාපොරොත්තු වෙමින් සිටින අතර මගේ සැමියා බොහෝ දුක් විඳිමින් සිටින්නේ. මමත් මගේ දරුවන් සමඟ බොහෝ අසරණව සිටින අවස්ථාවක මෙවන් දෙයක් ලිවීම ගැන මට හරි කණගාටුයි. ඉතිං මේ හැමදෙයක්ම ජීවිත කතාවට උරුම වෙච්ච දේවල්.

ඉස්සර අපි කුඹුරු වැඩ කරගන්නේ තනියම. දැන් යායේ අනිත් අයත් වැඩ වලට උදව් වෙනවා. කුළියට කියලා අපි වෙන අයව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නේ නැහැ. ඒ විතරක් නොවේ. අපි අපේ වැඩ ඉවර වෙලා අහළ පහළ වැඩ අත පහු වෙලා ඉන්න අයටත් උදව් වෙනවා. දැන් නම් මගේ කුඹුර කරගන්න තරම් බැරි තත්වයක් උදාවෙලා තියෙන්නේ. ඔහුගේ දැඩි අසනීප තත්වය නිසා මට පුදුම වේදනාවක් ඇතිවෙන්නේ.

අපි 'සුභානි' තැන්පතුවක් ආරම්භ කරගෙන තිබෙනවා. ඒ වගේම හදිස්සි ණය ෆෝම් එකක් නිතර බැංකුවේ තියන්න ඕනෑ. ඒ අපේම පහසුවට.

මේ කථා පුවතේ අඩු පාඩු රාශියක් ඇත. මගේ සැමියා ලෙඩ ගානේ නිසා මට හරි හැටි කල්පනා කරල ලිවීමට අපහසුයි. වැරදි ඇතිනම් මා හට සමාවෙන්න.

වරක් අප බැංකු ශාඛාව බිඳ වැටී සාමාජික සාමාජිකාවන් 35 දෙනෙක් පමණක් ඉතිරි වෙලා තිබුනා. ඒ වෙලාවේ නවගහඇල බැංකු ශාඛාවේ  අයත් සමඟ සාකච්ඡා කරලා අළුත් නායිකාව ලෙස ජයන්ති ඔයා පත්වෙන්න බය නැතිව කියලා කිවුවා. එයාව පත්කර ගත්තේ නැති නම් අද බැංකු ශාඛාවක් නැහැ. අද නුවරගල අපි මේව ලියන්න අනිවාර්යයි. කුස්සිය මුල්ලේ සිටිය අපි අද ඕනෑම තැනක බය නැතිව ඉදිරියට ඇවිදින් කථා කරන්න හැකියාව ලබාදුන්නේ අපගේ නිර්මාතෘ ගරු නන්දසිරි ගමගේ මැතිඳුන්ගේ වැඩසටහන. අප වැඩසටහන බිඳී ගිය අවස්ථාවේ  පත්වුන නායිකාව ගරු ජයන්ති මල්ලිකා මහත්මියට ද අපගේ වැඩසටහන ඉදිරියට ගෙනියන්න උදව් වුන සියලුම නායිකාවන්ට හා සියලුම සාමාජිකාවන්ට මගේ අවංක ආදර ස්තූතිය පුද කරනවා.

මගේ 'සුමුදු' කණ්ඩායම හදා ගත් ආකාරය මෙසේය. G.4 නායිකාව ලෙස මුලින්ම පත්වුනේ එස්.වසන්ති පුෂ්ප කුමාරියි. ලේකම් නන්දාවතී. සභාපති ඒ.ඇම්.කිරිමැණිකා ඇතුළු සාමාජිකාවන් 13 දෙනෙක් සිටි අතර අප කණ්ඩායම පිහිටුවේ 1997-1-28 අංක 01 නිවසේය.



කණ්ඩායම කරගෙන යන අතරෙදි මගේ ගේ බිත්ති බඳින්න පටන්ගෙන තිබුනා. ඒ වෙනවිට බාස් කුලී දෙන්න සල්ලි ටිකක් සොයාගෙන තිබුනා. ඒවා මදි වෙලා මගේ කණ්ඩායමෙන් මම ණය ලබා ගත්තා. ඊට පසුයි බාස්ලාගේ පඩි ගෙව්වේ. අපි බොහොම දුකසේ තමා ජීවත් වුනේ මට මතකයි 20% ක පොළියට අරගෙන මගේ සැමියාට බෙහෙත් අරගෙන තියෙනවා. කුඹුරේ වී ටික රු 1800 දීලා වත් ණය බේරන්න බැරි වුනා. මගේ සැමියා නුවරගලට ආවාට පසු දැනට අවුරුදු දහයක් වෙන අතර ඒ කාලේ සිට ලෙඩ වෙලා ණය වෙලා තමා මම එයා බේරා ගත්තේ. ඒත් කුඹුර උගස් කරන්නේ නැතිව බඳු දෙන්නේ නැතුව මම ණය වේවී ණය බේරගෙන ආවා. දැන් හරිම අමාරුයි. ඒ කියන්නේ එයාගේ වකුගඩුවක් හා අක්මාවක් දියවෙලා කියලා දොස්තර මහත්තුරු කියනවා. දැන් මාස 8ක් ලෙඩ වෙලා ලෙඩ ඇඳේ ඉන්නේ. දහසක් දේවල් හිතේ තියෙන්නේ කොහොම ලියන්නද?

බිත්ති ටික හදාගෙන වහලේ ගහගෙන සල්ලි හොයන්න ළුනු හිටෙව්වා. අපි එහෙම කරලා හරි වහලේ ගහගන්න සල්ලි හොයන්න තමා උනන්දු වුනේ. අනේ එතකොට මගේ දරුවෝ පොඩි අය. පුතාට තාත්තාට උදව්වක් කරන්න පුළුවන්කමක් නැහැ. දැන් අවුරුදු 2 ක කාලයක ඉඳන් තමා උදව් තියෙන්නේ. එයාගේ උදව් ලැබෙනකොට තාත්තා ලෙඩ වෙලා. ඉතිං පුතාත් මමත් තනියම හරි කුළි දෙන්නැතිව කුඹුරු වැඩ කලේ.

මගේ පරණ ගෙයි බිත්ති කඩා වැටෙනකම් බැරිවුනා අලුත් ගේ වහලේ ගහගන්න. එහෙම උනේ අපිට ළුනු වලින් හොඳ ආදායමක් නැති නිසයි. ඒවා හිටවලා වත් අපිට බැරි වුනා හොඳ ආදායමක් ලබාගන්න. ඉතිං මගේ ගේ වහලේ කඩා වැටුන වෙලාවේ කණ්ඩායමේ නායිකා මහත්මිය සාමාජිකාවන් හා සාකච්ඡා කොට  බැංකු ශාඛාවේ ගරු නායිකාව හා එකතු වී මට ණය පොදියක් ලබා දුන්නා. එයින් මම කාමර දෙකක් හදාගත්තා. අදටත් ඒ කාමර දෙක විතරයි. තවම මට කුස්සියක්වත් හදන්න බැරි වුනා. දැන්නම් මගේ. ආර්ථික තත්වය හොඳටම බිඳ වැටිලා. අපි ඒ ගෙට ගියාට පසු තමා මගේ කණ්ඩායමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වසරක් ගතවුනේ. මගේ ගෙදර තමා කණ්ඩායමේ සංවත්සර උත්සවය ගත්තේ.

ඒ වගේම අපි වතුර නැතිව ගොඩක් දුක් වින්දා. වතුර ලබා ගැනීමට අපි මීට පෙර ළිං දෙකක් කැපුවා. එතකොට පුතාලා පොඩියි. බඹ දෙකක් විතර කපලා හරි අමාරුයි කියලා නතර කරනවා. නැවත දවස් දෙකකින් විතර කපනවා. පුතාලා පොඩි අය නිසා එයාලගෙන් උදව් තිබුනේ නැහැ. ඒ ළිං කඩා වැටුනා. එසේ සිදුවුනේ එකපාරට ළිඳ බැඳගන්න සල්ලි තිබුනේ නැති නිසා. මේ සැරේ ළිඳ කපලා කොහොම හරි බැඳ ගත්තා. ගොයම් කපලා ළිඳ බඳින්න හිටියොත් ළිඳ කඩා වැටෙන නිසා නායිකාව කිවුවා ළිඳ බඳින්න නැවත ණය පොදියක් ඉල්ලමු කියලා. ඒ වන විට මා ගත් ණය රුපියල් 6000ක් ගෙවලා තිබුනා. රුපියල් 7000ක් ගෙවන්න තිබුනා. ඊටපසු බැංකු ශාඛාවේ ගරු නායිකාතුමිය කියා සිටියා කණ්ඩායමේ සාමාජිකාවකගේ ණයක් ගෙවන්න තියෙනවා ඒත් ඒකට තව කල් තියෙන නිසා ඔයා කැමතිනම් ඔයාගේ නායිකාවත් එක්ක කතා කරගෙන එන්න කියලා. මගේ නායිකාවත් එයට කැමති වෙලා එම ණය පොදිය ලබා දුන්නා. මම එම ණය පොදියෙන් රුපියල් 7000ක් ගෙවලා තමා ළිඳ බැඳගත්තේ. මට ඒ ටික මගේ දරුවන්ට ඇති. මට ඕන වෙලා තිබුනේ ළිඳ බැඳගන්න තමා. මට පුළුවන් හැටියට මම මේ දේවල් දරුවන්ට කරලා දෙනවා.

මගේ බැංකු ශාඛාවේ නායිකාව ඇතුලු මගේ කණ්ඩායමේ නායිකාව හා සාමාජිකාවන්ද අනිකුත් නායිකාවන්ට ද මගේ අවංක ආදර ස්තූතිය පුද කරමි.

අපි මේ කන්නේ ළිඳ බැදලා ඊළඟ කන්නේ කුස්සිය හදා ගනිමු කියලා කතා වුනා. ඒ වෙලාවේ තමා මගේ සැමියා නැවත ඔත්පොල වුනේ. දැනට මේ තරම් දුරට හරි ගෙනාවේ මගේ උත්සාහයෙන් මට ආයේ ණය වෙන්න තැනක් නැහැ. ඒ මන්ද මම කාන්තා බැංකුවෙන් පුළුවන් තරම් ණය අරගෙන තියෙනවා. අපේ සුහද එක්සත් මරණාධාර සමිතියෙනුත් ණය ලබා ගෙන තියෙනවා. ණය අරගෙන බේරන්න



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඕනෑ. 2002-08-04 වෙනි දින පටන් මේ වෙන විට මගේ සැමියාට ලේ තුන් පාරක් දුන්නා. දැනට ලේ ෆයින්ට් 9 ක් දීලා තියෙනවා. එක දවසක් ගියාම වාට්ටුවේ නැවතුනාම දවස් 7 - 8 ක් විතර ඉඳලා තමයි එන්නේ. එතකොට රු. 2000 - 3000 ක් විතර යනවා. මගේ ගෙදර උපයන්නෝ ලෙඩ වුනාම යැපෙන්නෝ මොනවා කරන්නද? මට අදහා ගන්නත් බෑ. මේවාට මොනවා කරන්නද කියලා. මට නම් සතුටක් කියලා ඇත්තෙම නෑ. අපේ වගේ ජීවිත තවත් මේ ලොකේ තියෙනවාද? මම සතුටු වෙනවානම් සතුටු වෙන්නේ කණ්ඩායම් සමිතියකට ගිය වෙලාවට විතරයි. මේ ලියන්නේ නුවරගල කාන්තා බැංකුවේ විගණන කමිටුවේ සභාපති ඇත්තටම කියනවානම් මම ඒකෙන් අස්වෙන්න ලිපිය දීලා තියෙන්නේ. ඒ මොකද මට යාමට ඊමට අපහසුයි. මම මේ ලියන්නේ මගේ දුක ගැනමයි. මගේ දරුවනුත් මම මේ කියන විදියට නුවරගල තනිවෙලා නෑ. ඒ මගේ කාන්තා බැංකුව නිසා මම එයින් ගන්න පුළුවන් තරම් උපරිම ණය අරගෙන තියෙන්නේ. මම ගනු දෙනු කරන කඩෙනුත් ණය අරගෙන තියෙනවා. මට කිසිම දෙයක් කරකියා ගන්න බැරුව අසරණ වෙලා දැන් ඉන්නේ.

**D / 1** ගොවි සංවිධානය මට කිවුවා ස්වෙච්ඡා සංවිධාන වලට ලියුම් දෙන්න කියලා. ඒවායෙන් ආධාර දෙනවා කියලා. මගේ සැමියා ජනවාරි පළවෙනිදා ඉස්පිරිතාලේ එක්කරගෙන ගියා අමාරු වෙලා. මම මගේ දරුවන්ට කියලා ගියා පුළුවන්නම් ලියුමක් ලියලා දෙන්න කියලා. ඒත් මගේ දරුවන්ට තේරෙන්නේ නෑ ලියුම් ලියන්න.

අපට හිතවත් මල්ලී කෙනෙක් හිටියා ප්‍රියන්ත කියලා. ඔය වැඩේට සුදුසු කෙනෙක් ඉන්නවා මම ඒ අයියගෙන් අහල බලමු කියලා එයා කිවුවා. යන ගමන ගිහින් එන්න කියලා. මම හවස 3 1/2 විතර ලෙඩා බලලා ගෙදර ආවා. ඊටපසු ගොවි සංවිධානයට එන්න කියලා පණිවිඩයක් එවලා තිබුනා. මම එම සමිතියට ගියා. ඊටපසු ඇහුවා ඔබතුමිය අපෙන් බලාපොරොත්තු වෙන්නේ මොනවද කියලා. මගෙන් එහෙම අහන විට මට උත්තරයක් දෙන්න තරම් අමාරු වුනා. ඒතරමටම අපේ අසරණකම දැඩිවෙලා. මම කීවා මගේ සැමියා දැනට අවුරුදු 8 10 විතර කාලයක් සිට ලෙඩ වෙලා දැන් මාස 6ක් පමණ ජීවත්

කරන්නේ ලේ දීලා නිසා මට ඒවවත් කරගන්න හැකියාවක් නැහැ කියලා. මගේ සහෝදරයා දුප්පත් මට දැන් කිසිම දෙයක් කරකියා ගන්න හැකියාවක් නැහැ කියලා. මම මගේ කතාව ඉවර කළා.

පසුව එයාලා කීපදෙනෙක් එකතු වෙලා නුවරගල හැම ගෙයක් ගානේම ඇවිදලා පසු දින සෝමදාස මහත්තයත්, සිරිසේන මහත්තයත්, නවරත්න මහත්තයාත්, ප්‍රියන්ත මහත්තයාත් මට රුපියල් 9845 ක් එකතු කරලා දුන්නා. දිසානායක වෙළඳසැලෙන් රු 1000ක් ලැබුනා. එම මුදලින් මගේ සැමියාට උවමනා කරන බෙහෙත් ටික අරගෙන දෙනවා. එදා මට ඒ මුදල ලක්‍ෂයක මුදලක් තරම් වටිනවා. ඉතිං ගමේ අය මට දෙවිවරුන් වගේ පිහිට වුනා. එම උදව්ව මට කිසිදා අමතක වෙන දෙයක් නෙවේ.

මගේ සැමියා ලෙඩවෙලා ඉන්නකොට මගේ කණ්ඩායමේ නායිකාව කීවා මෙහෙම පොතක් ලියන්න කියලා. අපට මේවා හොඳට ගලපලා ලියන්න තේරුම් මදි. ලිවීමට වැඩි අත්දැකීමක් නැති නිසා. අද මගේ මෑණියන්ටත්, පියාණන්ටත්, ශිල්ප ශාස්ත්‍රය මැනවින් කියාදුන් ගුරුමෑණිවරුන්ටත්, ඒ වාගේම මෙවැනි පොතක් ලිවීමට ඇරයුම් කළ ගරු නන්දසිරි ගමගේ මැතිඳුන්ටත්, අපගේ වැඩ සටහන කරගෙනයන මගේ නායිකාවටත්, ඒ වාගේම බැංකු ශාඛාවේ ගරු නායිකාවත් ඇතුළු සියලුම නායිකාවන්ට හා කමිටු නායිකාවන් සාමාජික සාමාජිකාවන්ට සියලු දෙනාටත් නොකිවුන සියලු දෙනාට මගේ අවංක ආදර ස්තූතිය පුද කර සිටිමු. මෙහි දහසක් වැරදි ඇති එයට සමාව අයදිමි.

මෙහිදී මගේ මව්පියන්ද ආදරයෙන් සිහි කරමි.

මෙම වැඩසටහන හඳුන්වා දුන් සියලු දෙනාට බුදුබව ලැබේවා කියා ප්‍රාර්ථනා කර මෙතනින් මගේ කථා පුවත නිමා කරමි.
මෙයට
ඊ.එම්.කිරිමැණිකා.
ඔබට සියලු දෙවි රැකවරණයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්තූතියි.
(කිරිමැණිකා නැවත ලියයි.)

ඇත්තටම මම මගේ කතා පුවත අවසාන කර මගේ බැංකුවේ නායිකාව වෙත යවලා තිබුණත්, එය නැවත වෙනස් කරන්න සිද්ධ වුනා. ඒ ගැන මම බොහොම කණගාටු වෙනවා.

මම මගේ සැමියා ගැන මේ පුංචි පොත් පිංච තුළ ලියලා තිබුනා. එයා වකුගඩු රෝගියෙක් කියලා තිබුනා. හිතන්න බැරි ඉරණමකට අපිට මුහුණ දෙන්න සිද්ධ වුනා. අපි වාගේ පව්කාර ජීවිත තවත් තියෙනවාද මගේ සැමියා 2003-02-23 වෙනි දින මිය ගියා. මට පුළුවන් උත්සාහ ගත්තා. ඒත් මට මගේ සැමියා බේරාගන්න බැරිවුනා. මගේ සැමියාගේ නම ඩී.ඒ.ටිකිරි බණ්ඩා. අසරණව සිටින මගේ දරුවන් තිදෙනා මෙසේය.
ඩී.ඒ.චමිලා ප්‍රියන්ති කුමාරි
ඩී.ඒ.උපුල් වසන්ත කුමාරි
ඩී.ඒ.මංජුලා මල්කාන්ති
මගේ නම ඒ.ඇම්.කිරිමැණිකා

මම ඒ මොහොත වෙන විට සිටියේ පොළොන්නරුවේ මහ රෝහලෙයි. මගේ පිරිමි දරුවා පමණයි ළඟ සිටියේ. මගේ ළමයි තව ඉගෙන ගන්නවා. පිරිමි දරුවා නම් ඉගෙන ගන්නේ නෑ. මම සෑහෙන්න ණය තුරස් වෙලා නුවරගලට. එම ණය අප කාන්තා බැංකුවට හිඟ තියලා තමා ඉන්නේ. අපි මේවාට එනකොට ආවේ අත පය විතරක් අරගෙන. ටිකක් හරි සැනසෙන්න තියෙන්නේ සමිති වලින් විතරයි. මම සමිතියට සිටින නිසා මට ගොඩක් හයියක් ආවා. මගේ නෑදෑයෝ පිරිස වගේ මට මගේ ස්වාමිපුරුෂයාගේ ආදාහන කටයුතු කරගන්න මගේ කාන්තා බැංකුවේ අය ගමේ අය හා අහළ පහළ සියලු දෙනාම පැමිණියා. ඉතිං ගරු නන්දසිරි ගමගේ මැතිඳුනි ඔබගේ මේ වැඩසටහන මීට පෙර කී පරිදි මට මානෙල් මලක සුවඳ පැතිරෙන්නා වගේ. සියලුදෙනාම එම අවස්ථාව දැනගත් වහාම කඩිරැල වගේ අපේ ගෙදර පිරිලා හිටියා. මට කියලා කරන්න දෙයක් තිබුනේ නෑ.

මට මේ කරන උදව් වලට අනේක වාරයක් ස්තූති කරමි. මගේ මරණාධාර සමිතිය, ක්‍රීඩා සමිතිය, සමෘද්ධි සමිතිය වැනි සමිති සමාගම් වලට මම අනේක වාරයක් ස්තූති කරමි. අපේ ජීවන රටාව දිහා බලනකොට මේ වගේ දෙයක් වුනහම අපි අන්ත අසරණ වෙනවා. ඒ වෙලාවට අපේ දුක කියා නිම කළ නොහැකිය. කොයි දේකටත් මුහුණ දීමට අපි සමඟියෙන් සිටින්න ඕන.

මේ හැමදේටම මම ඇපකැප වෙලා සිටියොත් තමා මගේ දරුවන්ටත් හොඳ අනාගතයක් සැලසෙන්නේ. අපට දැන් තමා ප්‍රශ්න තියෙන්නේ. මට හරි බයක් දැනෙනවා මේවා මැඩගෙන කොහොමද ඉදිරියට යන්නේ කියලා. මම කුඩා කල සිටම ප්‍රශ්න වලට මුහුණ දීලා තමා ඉදිරියට ආවේ. ජීවිතේ දිහා බැලුවහම තමා තේරෙන්නේ ජීවිතය ගොඩනඟා ගැනීම මොන තරම් අසීරු කාර්යයක්ද? ඉපදුන දා සිට මැරෙන මොහෙත දක්වා ජීවිතයට කොතරම් බාධා පැමිණෙනවාද?

අප්පා නැති දරුවන් නුවරගලට සීමා වෙලා හිටියා. මට තව කරන්න දේවල් එහෙම්ම තියෙනවා තව ඉදිරියට මොනතරම් ප්‍රශ්න ඒවිද? මට තව දරු තිදෙනෙකුගේ කටයුතු කරන්න තියෙනවා. හිත ධෛර්යය අරගෙන මම ඒ ප්‍රශ්න විසඳනවා. මම ඉස්සර කිසි බයක් නැතුව වැඩ කළා. දැන් එහෙම බැරි නිසා සියලුම බර කරට අරන් කරන්න වෙනවා.

සැමියා සිටි නිසා මොනතරම් දේවල් ආවත් අපි බය වුනේ නැහැ. ඉස්සර අක්කයි මමයි මඟුල් ගෙදරක් තියෙනවා කීවොත් ජයමංගල ගාථා කියන්න යනවා. අපි ඒවාට යන්නේ හරි විනෝදයකින්. වර්තමානය දිහා බලනකොට ගොඩාක් කණගාටු තත්වයක තමා සිටින්නේ. මගේ සැමියා නැති වුනාට පසු මේ කන්නය මට තනියම කරන්න වෙලා තියෙන්නේ. මම මගේ දරුවන් තිදෙනා හොඳින් රැකගෙන එන හැමදේකටම මුහුණ දෙන්න සූදානම්. කරදර කම්කටොළු කොපමණ ආවත් ඒ හැමදේකටම මුහුණදීලා ඉදිරි දියුණුව ගැන හිතන්න ඕනෑ. මෙය මට විතරක් මේ ලෝකේ සිද්ධ වුන දෙයක්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවේ. හැමෝටම සිද්ධ වෙන දෙයක්. මේ දුක දරුවන්ට කියලා වැඩක් නැහැ. මට ඉතිරි වෙලා තිබුනේ සැමියා වෙනුවෙන් මගේ හුස්ම ටික දෙන එක විතරයි. ඉතිං ඒක මට විතරක් නොවේ මේ ලෝකේ කාටවත් කරන්න බැරි දෙයක්. මගේ දරුවන් නිසා මම හිත හදාගෙන ජීවත් වෙනවා. මම එයාලා පුලුවන් විදියකට රැක බලා ගන්නවා. මට එයා කිසිම දෙයකට ගහලා බැනලා නෑ. එයා ලෙඩෙක් හැටියට හිටියොත් ඇති කියලා තමා මම හිතුවේ. දැන් මට කරන්න තියෙන්නේ මගේ සැමියාට නිවන් සුව පැතිමයි.

තවද මම සුභානි තැන්පතුවක් දාලා තිබුනා. ඒකෙන් රු 4500ක මුදලක් ලැබුනා මම අසරණව සිටියදී. මගේ සැමියාගේ දේහය ගෙදරට ගෙනාවට පස්සේ කිසිම ණය වීමකින් තොරව වැඩකටයුතු කරගත්තා. ඇත්තටම මට පින්කම් කරගන් පවා මුදල් ලැබුනා. සමිති දෙකකටම බැඳිලා තිබුන නිසා එය හොඳින් කරගත්තා.

ගලනා රුධිර මෙන් දිය වර රකින්නෙමි
දුවනා නහර මෙන් මගේ දරු රකින්නෙමි
ඇස් දෙක වාගේ මගේ දරුවන් රකින්නෙමි
හවුලෙන් එකමුතුව දිවි සර රකින්නෙමි

මගේ තියන හැම බාධක දුරුවේවා
වදේ බඹරු ලෙස පිරිවර ඇතිවේවා
මලේ පැහැය මෙන් අපි සැම වැජඹේවා
දවසින් දවස නව මං පෙත් ඇතිවේවා

නැවතත් පෑන අරගෙන මම ලියන විට
පෑනේ තුඬට වැටුනයි මගේ කඳුළු කැට
මොකද කරන්නේ පූරුවෙ කල පවට
මතක් වුනා මගේ පෙම්බර සැමියා මට

මට දැන් ඕනෑම දුකක් ඕනෑම වේදනාවක් විඳ දරා ගන්න ශක්තියක් තියෙනවා. කලු ගල් කඩලා අවුරුදු 8 ක් මටත් මගේ දරුවන්ටත් කන්න බොන්න දුන්න සැමියා නැතිවුනාට පසු ඒ වේදනාවෙන් මට දරාගන්න බැරි ගින්දරක් ඇවිලෙනවා. දරු තුන් දෙනෙක්ගේ කටයුතු සේරම දාලා තමා එයා ගියේ. එන හැම බාධක වලට මම මුහුණ දෙනවා. මට දැන් වයස අවුරුදු 42 යි. මම වගේ දුක් වින්ද ගැහැණියක් තව ඉන්නවද කියන්න අමාරුයි. දරු තුන්දෙනා හොඳට ජීවත් කර ගත්තොත් තමා මට ඇති එකම සතුට. ඉතිං මම මේ දුක්බර ජීවිත කතා පුවත මෙතනින් හමාර කරමි.

ඔබ සියලු දෙනාට ලොව්තුරා බුදු බව ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

- නිමි -



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# கடவுள் துணை.

எனது பெயர் ஏ.எம். கிரிமெனிகா. எனது வயது 42. பிறந்த திகதி 1960-11-22

எனது அன்பார்ந்த தாய்மார்களே, தந்தைமார்களே, உங்களிடத்தில் அனுமதி பெறுகிறேன். இந்த கதையை எழுதுவதற்கு முன்பாக உங்கள் எல்லோருக்கும் எனது அன்புகலந்த உண்மையான நன்றியை தெரிவித்துக் கொள்கிறேன்.

அதே போல் எனது கதையை எனக்கு முடியுமான வரை ஞாபகம் உள்ள மாதிரி எழுதுவதற்கு எதிர்பாக்கிறேன். இந்த கதையில் குறைபாடுகள் ,பிழைகள் ஏற்பட இடம் உண்டு. அதற்கு நான் முதலில் மன்னிப்பு கோரிக்கின்றேன். அது ஏனென்றால் நான் 5 ம் வகுப்பு வரை மட்டும் படித்துள்ளேன்.

எனது தாய் தந்தையர் நாங்கள் சிறு வயதில் இருந்து "நெல்லியே" என்ற ஊரில் சில காலம் இருக்கையில் எமக்கு காணிகள் கிடைத்து. "பக்வடுனா"திட்டத்தின் கீழ் காணிகள் கிடைக்கும் போது எனது வயது 6 இருக்கும். எனது அம்மாவும் அப்பாவும் எங்களை பாட்டியிடம் வைத்து விட்டு சென்றார்கள். அந்த காணிகளுக்கு பின்பு எங்களை அழைத்துக் கொண்டு சென்றார்கள். அந்த காலத்தில் வயலில் வீடுகளை கட்டி வாழ்ந்தோம். அதற்கு பின் காணிகளில் அரசாங்கத்தழனால் வீடுகளை கட்டி கொடுத்தார்கள். எங்கள் ஊருக்கு சொல்வது "போகொல்லயாய" என்று. அந்த காணிகளில் தென்னை,வாழை, பயறு, கௌபி, குரக்கன்,போன்றவை தான் வளர்ப்பாகள். இன்னும் கிழங்கு வகைகள் போன்றவையும் வளர்ப்பார்கள். எங்களுக்கு வயல்கள் இருந்ததற்கு ஒருபோகம் விட்டு ஒருபோகம் தான் விளையும். பெற்றோர்கள் எங்களை வளர்ப்பதற்கு மிகவும் பாடுப்பட்டார்கள். எங்கள் வீட்டில் பெண்பிள்ளைாள் 4 பேர்.



ஆண்பிள்ளைகள் 4 பேர். அதில் நானும் அக்காவும் இரட்டையர்கள். நான் சிறு வயதிலேயே "அஸ்மா" நோயாளியாக காணப்பட்டேன். என்னை காப்பற்ற எனது தாய், தந்தையர் மிகவும் கஷ்டப்பட்டார்கள்.

நாங்கள் பாடசாலை செல்வதற்கு சுமார் 2மைல் தூரம் செல்ல வேண்டும். அந்த காலத்தில் போக்குவரத்து வசதிகள் இல்லை. நாங்கள் நடந்து தான் செல்வோம். அந்த காலம் இப்பொழுது போல் இல்லை. எழுதுவதற்கு கரும்பலகையும், வெண்கட்டி தான் இருந்தது. இப்படி இருக்கையில் ஒரு நாளில் கரும்பலைக உடைந்து விடும். அந்த நாளில் அடிவாங்குவோம். அந்த காலத்தில் இருந்த ஆசிரியர்கள் அகராதி பிடித்தவர்கள். இப்பொழுது போல் இல்லை. அக்காவைவும் என்னையும் ஒரே வகுப்பில் சேரடதடதார்கள். நான் பாடசாலையில் வேலைகள் செய்யாமல் அக்காவிடம் இருப்பேனாம். இப்படி. அப்படி 2 வருடங்கள் இருக்கையில் என்னை வேறு வகுப்புக்கு மாற்றினார்களாம். அப்படி இருந்தும் தப்பமுடியாமல் போகுமாம். நான் அக்காவின் வகுப்புக்கே போவேனம் . இப்படி நான் அக்காவிடமே தான் இருந்திருக்கிறேனே தவிர படித்தில்லை. அந்த காலத்தில் ஒன்றாய் இருந்த படியால் எங்களை பிரிக்க முடியாமல் போனது. உண்மையிலேயே நாங்கள் ஒருவரை விட்டு ஒருவர் இருக்க மாட்டோம். எங்களுக்கு சிறு வயதில் நோய் ஏற்பட்டால், ஒரே நேரத்தில் ஏற்படும். எனக்கு நல்ல ஞாபகம் இருக்கிறது நான் இல்லாவிட்டால் அக்கா என்னை தேடுவாள். அக்கா இல்லாவிட்டால் நான் அவளை தேடுவேன். இப்படி தான் நாங்கள் காலத்தை கழித்தோம்.

எங்களது குடும்பத்தில் பெரிய ஆண்பிள்ளைகள் இல்லை. நாங்கள் தான் வீட்டு வேலைகளுக்கு உதவி செய்தோம். அப்பாவின் வயல் வேலைகளை செய்ய வேண்டும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கூலி வேலைகளுக்கு செல்ல வேண்டும். எங்களுக்கு இன்று போல்ஞாபகம் உள்ளது அம்மா வரிசையில் இருந்து தான் எஞ்களுக்கு துணி கொண்டு வந்து தருவார். அந்த காலத்தில் பெரிய உணவுபஞ்சம் ஒன்று இருந்தது. அம்மா வரிசையில் இருந்து பாண் வாங்கிக் கொண்டு வருவார். நாங்கள் அப்படி அந்த காலத்தில் கஷ்டப்பட்டோம். சிறுவயதில் நானும் அக்காவும் சண்டை பிடிப்போம். ஒரு நாள் அக்காவும் நானும் ஆற்றில் குளிக்க சென்று என்னை அற்றில் அடித்துக் கொண்டு சென்றது. அக்கா கத்தும் சத்தம் கேட்டு அருகில் குளித்துக் கொண்டு இருந்தவர்ளில் ஒருவருக்கு கேட்டு என்னை காப்பாற்றி கரைக்கு கொண்டு வந்தார். அதன்பின் 2 வருடங்களுக்கு பிறகு ஒரு முறை நான் கிணற்றில் விழுந்தேன். நான் மேலே வந்து செங்கல் ஒன்றை பிடித்துக்கொண்டு கத்தினேன். அப்பொழுது அம்மாவும் அப்பாவும் வந்து என்னை தூக்கி எடுத்தார்கள். நான் இது போல் நிறைய ஆபத்துக்களுக்கு முகம் கொடுத்திருக்கிறேன்.

நாங்கள் அந்த காலத்தில் "வறுமை ஒழிப்பு" திட்டத்தின் கீழ் வேலைகளுக்கு சென்றோம். நாங்கள் மிகவும் கஷ்டப்பட்டோம். மண் கூடைகளை தலையில் வைத்துக் கொண்டு மண் இழுத்த விதம் ஞாபகம் இருக்கிறது. இப்படி கஷ்டப்பட்டு துன்பமான வாழ்கையை நாங்கள் சிறு வயதில் இருந்து கழித்திருக்கிறோம். கோதுமை மா ரொட்டி குரக்கன் ரொட்டி சாப்பிடுவோம். அப்படி சாப்பிடும் போது வெறுக்து போகும் ஒருநாள் மரவள்ளி கிழங்கு பீங்கானுக்கு.. காலால் எத்தினேன். இ ப்படி சில காலம் செல்லும் போது, பெற்றோரின் விருப்பப்படி அக்காவும், நானும் ஒரே நேரத்தில் திருமணம் முடித்தோம். நாங்கள் 1981-03-25 திகதி தான் திருமணம் முடித்தோம். திருமணம் முடித்த 3 வருடங்கள் அவர்கள் வீட்டில் ஒன்றாய் வசித்தோம். இப்படி இருக்கையில் எனது கணவரின் அண்ணாவின் காணி துண்டு ஒன்று இருந்தது. எங்களுக்கு அந்த காணியில் வீடு ஒன்று கட்டி வாஇருக்க சொன்னார்கள். நாங்கள் அந்த காணியில் வீடு ஒன்று கட்டி



வழ்ந்தோம். இப்படி கொஞ்சம் காலம் சென்ற பிறகு எங்களுக்கு 3 பிளளைகள் பிறந்தது. பிள்ளைகனின் கால்களில் புண்கள் ஏற்பட்டது அவற்றிற்கு வைத்தியம் செய்து சுகமாக நிறைய நாட்கள் எடுத்தது. எங்களை வாழ வைக்க எனது கணவருக்கு தொழில் ஒன்று இருக்க வில்லை. எனது கணவர் எங்களை வாழ வைக்க கல் உடைத்தார். பிள்ளைகளுக்கு மருந்தேடுக்க போக அவருக்கு வர வசதியில்லை. ஏனெனில் வேலைக்கு செல்லாவிட்டால் நஷ்டம். கருங்கல் உடைப்பது என்பது இலகுவான வேலை அல்ல. மிகவும் கஷ்டம். செல்லா விடால எப்படி காசு தேடுவது என்று ஒரு நான் கூட இருக்காமல் வேலைவார். வேலைக்கு செல்லார். நான் தனியே சிறு பிள்ளைகளை தூக்கிக்கொண்டு மருந்தெடுக்க செல்வேன். அந்த காலந்தில் எங்களுக்கு உணவு முத்திரை இருக்க வில்லை. நான் மாவட்ட காரியாளயத்துக்கு சென்று தான் உணவு முத்திரையை செய்து கொண்டேன்எனக்கு இன்று போல் ஞாபகம் உள்ளது. உணவு முத்திரை 25 ருபாவிற்கும் குறைவாக இருந்தது. அதுவும் பிள்ளைகளுக்கு டிட்டும் தான். நாங்கள் திருட்ணம் முடித்து "தாலவ"என்ற ஊரில் 7,8 வருடங்கள் இருந்தோம். அதன் பின்பு எங்களுக்கு மகவலி சீ வலயத்தில் காணிகள் கிடைத்தது. அதுவும் சும்மா இருந்து கிடைத்தது அல்ல. மிகவும் கஷ்டப்பட்டு விண்ணப்ப பத்திரங்கள் போட்டு தான். காணியை எடுத்தோம். விண்ணப்ப பத்திரங்கள் போட்டு 11/2 வருடகாலம் இருந்தோம். நாங்கள் இந்த காணிகளுக்கு 1988-06-22 திகதி வந்தோம். அந்த காலத்தில் இங்கு வரும் போது இவை அடர்ந்த காடுகள். நாங்கள் காணிகளுக்கு வரும் போது. சம்பாதித்தது என்று ஒன்று இருக்க இல்லை. 375 ருபாவை எ.டுத்துக் கொண்டு வந்துதோம்.

மகாவிக்கு வரும் நாட்களில் எனது கணவர் லொரி ஒன்றில் பொருட்களை ஏற்றினார். அவருடன் கூட வருவதற்கு யாரும் இருக்க வில்லை. முதலில் காணிக்கு வரும் போது காணிச்சொந்தக்காரர் ஒருவரையாவது வரச் சொன்னதால், உடனே வீட்டுக்கு சென்று அப்பாவை அழைத்துக் கொண்டு



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

